# ආඩම්බරකාර මල



H.M. තෙවුනි සදෙස්නා හේරත්

# ආඩම්බරකාර මල

H.M. තෙවුනි සදෙස්නා හේරත්

**කර්තෘ**

3 ශ්‍රේණිය

**ශ්‍රේණිය**

මහ/මහාමායා බාලිකා විද්‍යාලය

**පාසල**

“සහෝදරයෝ”

**කර්තෘගේ වෙනත් කෘති**

10/05/2026

**දිනය**

978  624  211 080 - 6

**ISBN Number**

# පිදුම

වසර දෙකකට අධික කාලයක් මා
හට අකුරු කරන්නට සෙවණ දුන්
ආදරණීය මහාමායා බාලිකා
විදුහල් මෑණියන්ට සෙනෙහසින්
පුදන්නෙමි......

# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම් කළ හැකිය දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදී එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි මේ සඳහා නිර්මාණකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

## සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මුලික පද්නම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ සිසු දරුවන්ගේ දක්ෂතා නිර්මාණශිලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මගින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිල.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබා දෙනු ඇති බව මම විශ්වාස කරමි එමෙන්ම මෙවැනි, උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය ගුරු මණ්ඩලය සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමී මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමී.

සරත් බී.එස්. අභයකෝන්,

ආණ්ඩුකාරවර, මධ්‍යම පාළාත.

සම්මානිත මහාචාර්ය, පෙරාදෙණිය විශ්වවිද්‍යාලය.

2026-05-10

## සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් කැපවී සිටී එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞර්ෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ ශ්‍රී දළඳා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රර්ථනා.


ප්‍රදීප් නිලංග දැල,

දියවඩන නිලමේ,

ශ්‍රී දළදා මාළිගාව


2026.05.10

ඈත පිටිසර ගම්මානයක් තිබුනා. ඒ ගම්මානයේ ලස්සන මල් වත්තක් තිබුණා. ඉර පායනකොට මේ මල් වත්ත හරිම ලස්සනයි.



ඒ මල් වත්තට නිතරම සමනල්ලු, මී මැස්සෝ කුරුල්ලෝ මල් පැණි බොන්න එනවා.

එයාලා මල් පැණි බීවේ හරිම සතුටින්.



මේ මල් වත්තේ ලස්සන ලස්සන පාට පාට මල් ගොඩක් තිබුණා.

දවසක් දා මේ මල් වත්තේ ගොඩක් ලස්සන මලක් පිපුණා.



ඒ මල මල් වත්තේ පිපිලා තිබෙන අනෙක් මල් දිහා බලලා එයා හුගාක් ලස්සන නිසා ආඩම්බරයෙන් සිටියේ.



ඔන්න ඔහොම ඉන්නකොට ඒ ලස්සන මල ළගට ලස්සන සමනලයෙක් ආවා. මේ ආඩම්බර මල සමනලයාගෙන් මෙහෙම ඇහුවා. “බලන්න වැඩිය ලස්සන මම ද, ඔයාද” කියලා.



“මේ මල ලස්සන නිසා හොඳටම ආඩම්බර වෙලා ඉන්නේ” කියලා සමනලයාට තේරුම් ගියා. සමනලයා මල ළඟට ආවා.



සමනලයා හිතුවා මේ ආඩම්බරකාර මලට හොඳ අවවාදයක් දෙන්න ඕන කියලා.

“ඔයා ගොඩක් ආඩම්බර වෙන්න එපා සමනලයා” කිවුවා



ඒ දෙය අහපු මේ ලස්සන මල සමනලයාට හිනා වුණා.

“ඔයාට වැඩිය මම ලස්සන නිසා ඔයාට දුකයි නේද” කියලා සමනලයාගෙන් ඇහුවා.



සමනලයාත් හිනා වෙලා මෙහෙම කීවා.

“අපි දෙන්නාගෙම ලස්සන හැමදාම තියෙන්නෙ නැහැ. ඔයත් උදේට පිපිලා හවසට පරවෙලා හෙට බිමට වැටෙනවා. ඉන්න ටික කාලෙට ආඩම්බර වීම හොද නැහැ.”



සමනලයා දිහා බලා ගෙන හිටපු මේ ලස්සන මලට තමන් ගැන ම හොඳටම ලැජ්ජා හිතුනා.



ලස්සන මල සමනලයාගෙන් සමාව ඉල්ලුවා ආයේ කවදාවත් ආඩම්බර වෙන්නේ නැහැ කියලා බිම බලාගෙන කිවුවා.



# පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥායන්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවක් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම, අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි පාසල් දරුවන් තුල ශාස්ත්‍රිය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාට, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාළිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්

(ව්‍යාපෘති නිර්මාතෘ)

# ස්තූතිය

මා පුංචි කතුවරියක් කළ මහනුවර මහාමායා බාලිකා විදුහලේ විදුහල්පතිතුමීයටත්, ප්‍රාථමික අංශයේ විදුහල්පතිතුමීය හා මාගේ පංතිභාර ගුරුතුමීයන් වන වත්සලා ගුරු මෑණියන්ටත් ප්‍රමීතා වෙත්තසිංහ ගුරුමෑණියන්ටත්, අනෙකුත් ගුරු මෑණිවරුන්ටත්, ගුරු පියවරුන්ටත්, ආදරණීය අම්මා අප්පච්චි, අත්තා, ආච්චි, අත්තම්මාටත් මාගේ හෘදයාන්ගම ස්තූතිය පුද කරමී.!